**රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය -2021**

**-----------------------------------------------**

රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකනු ලබන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**------------------------------------------------------------------------**

ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ දක්ෂිණ අධිවේගී මාර්ගය සහ මධ්‍යම අධිවේගී මාර්ගය සම්බන්ධ කරමින් නව අධිවේගී මාර්ගයක් ඉදිකිරීම තුළින් රටේ උපායමාර්ගික හා සමාජ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ආසන්න වශයෙන් රු.මිලියන 286,000ක් වන අතර භාණ්ඩාගාර ලේකම්ගේ අධීක්ෂණය යටතේ දේශීය බැංකු පද්ධතියෙන් මූල්‍යයනය කිරීමට තීරණය කර තිබුණි. යෝජිත මහාමාර්ගය කිලෝමීටර 76.4ක මුළු දිගකින් සමන්විත කහතුඩුවේ සිට ඉංගිරිය රත්නපුර හරහා පැල්මඩුල්ල දක්වා ගමන් කරනු ලැබේ. මහාමාර්ගයේ කහතුඩුව අන්තර්හුවමාරුවේ සිට ඉංගිරිය දක්වා දිග කිලෝමීටර 24.3ක සිවිල් වැඩ 2021 ජුනි 30 දිින පිරිනමා තිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් 2022 මැයි 10 දින **තාවකාලිකව නවතා** තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

මාගේ වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

**----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම ඊට සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම**

**------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | දෙවැනි අත්තිකාරම සඳහා සහ 2021 වර්ෂය සඳහා අතුරු ගෙවීම් සහතික අංක 3 සහ 4 සඳහා ගෙවීමට අවශ්‍ය මුදල සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 4,161,77 | ව්‍යාපෘතිය 2022 වර්ෂයේදී ඉහත අතුරු ගෙවීම් සහතික ගිණුම්ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | 2021 දෙසැම්බර් 31 දිනට නිවැරදි වගකීම ගිණුම්ගත කිරීමට පියවර ගැනීම අවශ්‍යො වේ. |
| (ආ) | කොන්ත්‍රාත් පැකේජ 01හි අතුරු ගෙවීම් සහතික අංක 02 යටතේ මිලදීගත් ලිබඩු සහ සවිකිරීම්, කාර්යාල උපකරණ, පරිගණක සහ ජංගම දුරකතන යනාදී වත්කම්වල වටිනාකම සහ අදාළ ක්ෂය 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ | 10.97 | 2021 සහ 2022 වර්ෂ සඳහා ඉහත වත්කම් ගිණුම්ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ව්‍යාපෘතිය ගනු ලබන අතර 2021 වර්ෂයට බලපාන ලද අදාළ ගිණුම්කරණ සටහන් නිවැරදි කරනු ලැබේ. | වැරදි නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

මූල්‍ය ප්‍රකාශනවල දේපල පිරියත හා උපකරණ යටතේ වාර්තා කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව භෞතික හා මූල්‍ය ප්‍රගතිය

රුවන්පුර අධිවේගී මාර්ගයේ කටයුතු 2016දී ආරම්භ කර තිබුණද කහතුඩුව අන්තර් හුවමාරුවේ සිට පැල්මඩුල්ල දක්වා අධිවේගී මාර්ගයේ කිලෝමීටර 73.9කින් 2021 දෙසැම්බර් 31 දිනට කහතුඩුව අන්තර් හුවමාරුවේ සිට ඉංගිරිය දක්වා කොටසේ කිලෝමීටර 24.3ක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. කෙසේවෙතත්, කහතුඩුව අන්තර් හුවමාරුවේ සිට කිලෝමීටර 2ක් සහ ඉංගිරිය සිට පැල්මඩුල්ල දක්වා කිලෝමීටර 47.6ක් සඳහා ප්‍රසම්පාදන කටයුතු 2022 ජූලි 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. තවද, ඉංගිරිය සිට පැල්මඩුල්ල දක්වා මාර්ග කොටස සඳහා පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව සඳහා අනුමැතිය මධ්‍යම පරිසර අධිකාරිය මගින් ලබාදී නොතිබුණු බව නිරීක්ෂණය විය. එමනිසා, කහතුඩුව අන්තර් හුවමාරුවේ සිට ඉංගිරිය දක්වා අතරමැදි මාර්ග කොටසේ ඉදිකිරීම් රටට අඩු වැදගත්කමක් බවට පත්වේ.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ලැබී තිබුණු තොරතුරු අනුව කහතුඩුව අන්තර් හුවමාරුවේ සිට ඉංගිරිය දක්වා කිලෝමීටර 24.3ක කොටස ආරම්භයේදී වෙනම කොන්ත්‍රාත්කරුවන් හතර දෙනෙකු වෙත ප්‍රදානය කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේවෙතත්, ඉදිකිරීම් සමාගම විසින් ඉදිරිපත් කරන ලද අඩු ලංසු වටිනාකම සලකමින් කොටස් 4හි මුළු ඉදිකිරීම් කටයුතු එකම සමාගමක් වෙත පිරිනමා තිබුණි. සමාගම විසින් කොටස් 4 සඳහා වෙනම ඉදිරිපත් කරන ලද ලංසු වටිනාකම් 4 ඉංජිනේරු ඇස්තමේන්තුව සියයට 14 සිට සියයට 22කින් අඩු වුවද කොන්ත්‍රාත් කොන්දේසි අනුව ගෙවීම් නිරවුල් කිරීමට අසමත් වීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව ආරම්භක දින සිට දින 372කට පසුව 2022 මැයි 10දින කොන්ත්‍රාත්කරු විසින් කොටස් 4හි ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබුණි. | කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසිවල 16.1 උප වගන්තිය අනුව අතුරු ගෙවීම් සහතිකවලට ගෙවීම් ප්‍රමාදවීම හේතුවෙන් කටයුතු අත්හිටුවීමට කොන්ත්‍රාත්කරුට හැකිවේ. කටයුතු අත්හිටුවීම ආරම්භක දින සිට දින 372කට පසුව සිදුකර ඇත. | කොන්ත්‍රාත් කොන්දේසි සමඟ අනුකූලවීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | 2020 ජූලි 01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් කටයුතු සඳහා මූල්‍ය පහසුකම් රටේ දේශීය බැංකු මගින් සලසාගත යුතුවේ. අධිවේගී මාර්ගයේ කහතුඩුවේ සිට ඉංගිරිය දක්වා කොටසේ ඉදිකිරීම් කටයුතු 2021 ජූනි 30 දින රු.මිලියන 54,695ක පිරිවැයකට පිරිනමා තිබුණද, 2021 දෙසැම්බර් දිනට දේශීය බැංකු 2ක් මගින් රු.මිලියන 16,200ක මූල්‍ය පහසුකමක් පමණක් සලසාගෙන තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය විසින් 2021 දෙසැම්බර් දින වන විටත් ඉතිරි ඉදිකිරීම් පිරිවැය වූ | රටෙහි පවතින මූල්‍ය අර්බුදය හේතුවෙන් ණය ගිවිසුම අනුව ලංකා බැංකුව කොන්ත්‍රාත්තුවට මූල්‍යනය කර නොතිබුණු අතර 2022 ජූනි 30 දිනට කොන්ත්‍රාත්කරුවන්ගේ නිරවුල් නොකරන ලද | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට පෙර මූල්‍ය පහසුකම් ලබා ගැනීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |

| | |
|---|---|
| රු.මිලියන 38,495 පිළිබඳ කටයුතු කර නොතිබුණි. තවද, 2022 ජුනි 30 දිනට කොන්ත්‍රාත්කරුවන්ගේ නිරවුල් නොකරන ලද වගකීම් රු.මිලියන 5,410ක් දක්වා වැඩිවී තිබුණි. | වගකීම් රු.මිලියන 5,410ක් දක්වා වැඩිවී තිබුණි විය. |

**3.3 ව්‍යාපෘතියේ අරමුණුවලට බැහැරව කරන ලද ගෙවීම්**

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතියේ අරමුණුවලට පටහැනිව, සමාලෝචිත වර්ෂය තුළදී අතුරු ගෙවීම් සහතික අංක 03 යටතේ ව්‍යාපෘතිය විසින් එකතුව රු.මිලියන 1.8ක් වටිනා ජංගම දුරකතන 27ක් මිලදීගෙන තිබුණි. | මෙම ව්‍යාපෘතිය කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ ආරම්භ කර තිබේ. එමනිසා සියළුම වැඩබිම් කටයුතු මාර්ගගත ක්‍රමයට සහ වට්ස්ඇප් යනාදි විද්‍යුත් මාධ්‍ය මගින් අධීක්ෂණය කරන ලදි. එමනිසා ජංගම දුරකතන 27ක් මිලදී ගන්නා ලද අතර උපදේශකවරයෙකු පත්කර නොතිබුණු නිසා දත්ත එකතු කිරීම සහ ප්‍රගතිය අධීක්ෂණය කිරීම එමගින් සිදුකරන ලදි. | ව්‍යාපෘතියේ අරමුණු සමඟ අනුකූලවීමට පියවර ගැනීම අවශ්‍ය අතර අරමුණුවලින් බැහැර වීම හේතුවෙන් පැනනගින කිසියම් පාඩුවක් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය. |

**3.4 ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ ගැටලු**

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ලැබී තිබුණු තොරතුරු අනුව, කහතුඩුව සිට ඉංගිරිය දක්වා මාර්ග කොටසේ රජයේ ඉඩම් කොටස් 615ක් ඇතුලුව ව්‍යාපෘතිය විසින් අත් කර ගත යුතු මුළු ඉඩම් කොටස් ප්‍රමාණය 2,439ක් විය. 2017-2018 වර්ෂයේදී ඉඩම් කොටස් 2,060ක් සඳහා 38 (ආ) වගන්තිය ගැසට් කර තිබුණද, 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 17වන වගන්තිය යටතේ ඉඩම් කට්ටි 422 සඳහා පමණක් වන්දිය රු. මිලියන 222.24ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44වන වගන්තිය යටතේ කිසිදු ඉඩම් කට්ටියක් ලියාපදිංචි කර නොතිබුණි. | වර්තමානයේ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදුකරමින් පවතින අතර වන්දි ගෙවීමේ ක්‍රියාවලිය අවසන් වීමෙන් පසුව සියලුම ඉඩම් 44වන වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබේ. | ඉඩම් අත්පත් කර ගැනීම් සහ ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය වේ. |